**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය.**

------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2010දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සිදුකරන ලද විගණන නියැදි පරීක්ෂණයේ දී අනාවරණය වූ කරුණු ඇතුළත් නිරීක්ෂණ වාර්තාව ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලද අතර අදාල නිවැරදි කිරීම් සහ පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් කරන ලද.

1.2.2 **ගිණුම් වල වැඩියෙන් දැක්වීම**

----------------------------------

2005 අප්‍රේල් 21 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක UGC/HR/3/9/8 ප්‍රකාරව 2005 අප්‍රේල් 01 න් පසුව සේවයට බඳවා ගන්නා ලද අධ්‍යයන කාර්යමණ්ඩලයට පාර්තෝෂික ප්‍රතිලාභ ගණනය කිරීමේ දී අධ්‍යයන දීමනා සැලකිල්ලට නොගත යුතු වුවත්, කාර්යමණ්ඩලයේ සාමාජිකයින් හත් දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ ගෙවූ අධ්‍යයන දීමනා සැලකිල්ලට ගෙන පාර්තෝෂික ගණනය හේතුවෙන් රු:25,729ක මුදලක් වැඩියෙන් වෙන් කර තිබුණි.

1.2.3. **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) විවිධ හේතුන් නිසා දැනට සේවයේ නොයෙදෙන පුද්ගලයින්ගෙන් වසර පහකට වැඩි කාලයක සිට අය විය යුතුව ඇති රු: 270,586ක ණය මුදලක් මේ වන තෙක් අය කර ගැනීමට නොහැකිව තිබුණි.

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා අනෙකත් උසස් අධ්‍යාපන ආයතන සදහා වන ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 33 වගන්තිය ප්‍රකාරව විදේශ ගත වීම හො වෙනත් හේතු මත සේවයට වාර්තා නොකිරීමෙන් ගිවිසුම් කඩන ලද අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල නිලදාරීන් 07 දෙනකුගෙන් ආයතනයට අය විය යුතු වටිනාකම රු: 15,909,040 ක් වී තිබුණි.

1.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ පිරිවැය රු: 451,108,034 ක් හා ලියාහල අගය රු:106,018,108ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කළ නොහැකි විය.

(ආ) Learning Technology Research Lab (LTRL) ව්‍යාපෘති අරමුදල් වලින් රු: 527,845 ක මුදලක් PAN Localization ව්‍යාපෘතියට මාරු කර තිබුණු අතර ඒ සඳහා මූල්‍ය සැපයුම් ආයතනයෙන් ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.2.5 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම**

----------------------------------------------------------------------

පහත සදහන් අනුකුල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති,රීති රෙගුලාසි ආදියට යොමුව** | **අනුකුල නොවීම** |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 835 (2) (e) | කුලියට ගන්නා ගොඩනැගිලි වල කුලී ගිවිසුම් කාලය වසර තුන නොඉක්මවිය යුතු වුවත් ගොඩනැගිලි දෙකක් වසර පහකට ආයතනය විසින් බදු ගෙන තිබුණ අතර අදාල බදු ගිවිසුම්වල වටිනාකම රු:9,300,000 ක් විය. |

| | |
|---|---|
| (ආ)විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයෙ 27.3 ඡේදය | අවම පර්වාසික සේවාකාලය වසරක් සම්පූර්ණ නොවූ ආචාර්යවරුන් දෙදෙනෙකුට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විදේශ ගත වීමට අධ්‍යයන නිවාඩු අනුමත කර එම අධ්‍යයන කටයුතු සඳහා රු: 6,626,294 ක මුදලක් වැය කර තිබුණි. |
| (ඇ) 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය | සියලු රාජකාර් ගමන් සඳහා විදේශගත වන සියලුම නිලධාරීන්, කුමන අරමුදල් වලින් වියදම් දැරුවද, සිය ගුවන් ගමන් යානා පත්‍ර ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගම වෙතින් පමණක් මිළදී ගත යුතු බවට දන්වා තිබුණද ආයතනය විසින් රු:93,000ක් ගෙවා පෞද්ගලික ආයතනයකින් ගුවන් ටිකට් පත් මිලට ගෙන තිබුණි. |
| (ඈ)2004 ජුලි 29 දිනැති අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව 2010 ජුනි 30 දින වන විට රු: 207,782,066 ක මුදලක් විවිධ රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි. |
| (ඉ)2009 ජුනි 08 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභා ලිපි අංක යූජීසී/ටීයූඒ/2/ පීජීඑස් | විශ්වවිද්‍යාල පනතේ II කොටසේ 15 (ii) වගන්තියේ නියමයන් ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව සිදු කළ නියමයන් අනුව පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන බාහිර කථිකාචාර්යවරුන්ගේ ගාස්තු එක් දේශන පැයක් සඳහා රු: 2500 ක උපරිමයකට සීමා විය යුතු වුවත්, කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත පැයකට රු:3000 බැගින් ගෙවීම නිසා |

| | |
|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දී රු:324,875 ක් ඒ සඳහා වැඩියෙන් ගෙවීම් කර තිබුණි. |
| (ඊ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 චක්‍රලේඛය 7.4.1. ඡේදය | විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම සඳහා භාණ්ඩාගාර නියෝජිතයෙකු සහභාගි කරගත යුතු වුවද ආයතනයේ විගණන කමිටු රැස්වීම සඳහා භාණ්ඩාගාර නියෝජිතයෙකු සහභාගි කරගෙන නොතිබුණි. |

1.2.6. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛයක් ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2010 වර්ෂයේ දී රු: 82,171 ක් ගෙවා තිබුණි. මෙම දීමනා ගෙවීම රජයේ නීතිරීතීන්ට පටහැණි බවට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා තිබුණු නමුත් එම ගෙවීම අඛණ්ඩව සිදු කරමින් පැවතුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය කාර්යසාධනය

----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු: 76,739,145ක ඌනතාවයක් වු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේදී ඌනතාවය රු: 82,084,310ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු:65,381,575ක් වු රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු:11,357,570 ක් දක්වා අඩු වී තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා

රු:68,610,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු:13,474,310ක් දක්වා අඩු වී තිබුණි.

## 2.2 මෙහෙයුම් කාර්යසාධනය

---------------------------

### 2.2.1 කාර්ය සාධනය

-----------------

(අ) සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් පැවැත්වූ ප්‍රධාන ක්ෂේත්‍ර 2 ට අයත් අභ්‍යන්තර පාඨමාලා 4ක් සඳහා නවක සිසුන් 230 ක් බඳවා ගෙන තිබූ අතර, සිසුන් 229 දෙනෙකුට උපාධි ප්‍රදානය කර තිබුණි.

(ආ) ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා උපාධි වශයෙන් ප්‍රධාන අදියර තුනකින සන්නිවේදන තාක්ෂණය පිළිබඳ බාහිර පාඨමාලා ආයතනය විසින් පවත්වාගෙන ගොස් තිබුණ. අධ්‍යයන වර්ෂ තුන සඳහා සිසුන් 6366 ක් ලියා පදිංචි කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී ඩිප්ලෝමා 361 ක් ද උසස් ජාතික ඩිප්ලෝමා 199 ක් ද උපාධි 140 ක් ද ප්‍රදානය කර තිබුණි.

(ඇ) ආයතනය විසින් පශ්චාත් උපාධි පාඨමාලා 3 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර ඒ යටතේ සිසුන් 443 දෙනෙකුට අධ්‍යයන පහසුකම් සලසා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ ස්ථිර කාර්යමණ්ඩලයේ ආචාර්යවරු 17 ක් විසින් 2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා දේශන පැය 3660 ක් ද 2010/2011 අධ්‍යයන වර්ෂ සඳහා දේශන පැය 4015 ක්ද පවත්වා තිබූ අතර බාහිර කථිකාචාර්යවරුන් 17 දෙනෙකු විසින් පවත්වා තිබූ මුළු දේශන පැය ගණන 360 ක් විය.

### 2.2.2. අයවැය පාලනය

-----------------

ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් අයවැය ගත අගයන් සහ සත්‍ය වියදම අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකාර පාලන කාරකයක් වශයෙන් යොදාගත් බව නිරීක්ෂණය නොවිය.

### 2.2.3. කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.1(ආ) (iv) ජේදය පරිදි කොන්ත්‍රාත්තුව අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීමේ කාර්ය සඳහා, ඉංජිනේරුවකු හෝ උපදේශකයකු සේවයේ යෙදවීමට අපේක්ෂා කරන්නේ නම්, ඉංජිනේරුවරයාගේ හෝ උපදේශකවරයාගේ අධිකාර් බලය සහ කාර්යභාරය කොන්ත්‍රාත් ගිවිසුමේ පැහැදිලිව සඳහන් කල යුතු වුවත් එම උපදෙස් වලින් බැහැරව ආයතනය විසින්

රු:14,462,016 ක් පිරිවැය වූ ගොඩනැගිලි අළුත්වැඩියා කටයුත්තක කොනත්‍රාත්තු අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීමේ කාර්ය සඳහා පෞද්ගලික ආයතනයකින් උපදේශන සේවා ලබාගෙන උපදේශක සේවා ගාස්තුව වශයෙන් රු: 893,030ක් ගෙවා තිබුණි.

### 2.2.4. අනාර්ථික ගනුදෙනු

----------------------

කොළඹ විශ්වවිද්‍යාල අභ්‍යන්තර විගණන අංශය මගින් අමතර වියදමක් නොදරා අභ්‍යන්තර විගණන කටයුතු කර ගැනීමට හැකිව තිබියදී මුදල් පනත, විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි අභිබවා යමින් පෞද්ගලික විගණන ආයතනයක් වෙත අභ්‍යන්තර විගණන කටයුතු පවරා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී ඒ සඳහා ගෙවා තිබූ මුදල රු:248,623ක් විය.

## 3. පද්ධති හා පාලන

------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වරින් වර දන්වන ලදී. තව දුරටත් වත්කම් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.